# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 39 දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 නොවැම්බර් මස 10 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 4.25 යි. **තැපැල් ගාස්තුව :** රු. **5.00** යි.

## 2006 අංක 39 දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 නොවැම්බර් මස 06 වන දින]

එල්.ඩී.—ඕ. 61/2000.

### උඩරට විවාහ හා දික්කසාද පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි (113 වන අධිකාරය)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2006 අංක 39 දරන උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** 113 වන අධිකාරය වූ, විවාහ හා දික්කසාද පනතේ 41 වන වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 113 වන අධිකාරය වූ විවාහ හා දික්කසාද ආඥාපනතේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(4) යම් තැනැත්තෙක්—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ආ) පළාත් සභා මන්ත්‍රීවරයෙක් වුවහොත් ; හෝ

(ඇ) පළාත් පාලන ආයතනයක සභිකයෙක් වුවහොත් ; හෝ

(ඈ) ජනරජය යටතේ වැටුප් ලබන්නාවූ ධුරයක් දරන තැනැත්තකු; හෝ

(ඉ) රෙජිස්ට්‍රාර්වරයකුගේ රාජකාරි කටයුතු කෙරෙහි අගතිදායක ලෙස බලපෑමක් ඇති කළ හැකි ආකාරයේ වෘත්තියක නියුක්ත වූ තැනැත්තකු වේ නම්,

ඒ තැනැත්තා රෙජිස්ට්‍රාර්වරයකු ලෙස පත්කර ගැනීමට හෝ එසේ කටයුතු කරගෙන යැමට හෝ සුදුස්සෙක් නොවිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර යම් රෙජිස්ට්‍රාර්වරයකු නුසුදුස්සකු වන අවස්ථාවක, අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, එම තැනැත්තා රෙජිස්ට්‍රාර් ධුරයෙන් ඉවත් කිරීමට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට බලය තිබිය යුතු අතර එම ඉවත් කිරීම ගැසට් පත්‍රයේ නිශ්චිතව දක්වා ඇති දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(6) ඉල්ලා අස්වීමක් නිසා හෝ ධුරයෙන් ඉවත් කිරීමක් නිසා රෙජිස්ට්‍රාර්වරයාගේ ධුරයෙහි පුරප්පාඩුවක් ඇති වන අවස්ථාවක, 41 වන වගන්තියේ විධිවිධාන සැලකිල්ලට ගෙන ඒ පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.”

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**3**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.